# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1985 අංක 36 දරන
# ශ්‍රී ලංකා සාමෝදය පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1985 සැප්තැම්බර් මස 03 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1985 සැප්තැම්බර් මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : ශත 60 යි    තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1985 අංක 36 දරන ශ්‍රී ලංකා සාමෝදය පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1985 සැප්තැම්බර් මස 03 වන දින]

එල්.ඩී.—ඕ. 7/85.

**ශ්‍රී ලංකා සාමෝදය පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

**පූර්විකාව.**

" ශ්‍රී ලංකා සාමෝදය පදනම " යනුවෙන් හඳුන්වනු ලැබූ සහ සඳහන් කරනු ලැබූ සංගමයක්, එහි සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කර ගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබුණ හෙයින් ද:

එකී සංගමය පිහිටුවනු ලැබුයේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ කර ගෙන ගොස් ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

**1.** මේ පනත 1985 අංක 36 දරන ශ්‍රී ලංකා සාමෝදය පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**ශ්‍රී ලංකා සාමෝදය පදනම සංස්ථාගත කිරීම.**

**2.** මේ පනත ක්‍රියාත්මක වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින්මතු " සංගමය " යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සාමෝදය පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තානේ සියලු තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින්මතු " සංස්ථාව " යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු ඇතුළත් කරනු ලබන සාමාජිකයන් ද, " ශ්‍රී ලංකා සාමෝදය පදනම " යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේද පූර්ණ බලය හා අධිකාරය ඇතිව සංස්ථාව විසින් එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පැවරීම හා එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

**සංස්ථාවේ පොදු පරමාර්ථ.**

**3.** සංස්ථාවේ පොදු පරමාර්ථ—

(අ) සාමය සහ ජනතාවගේ ආර්ථික අභිවෘද්ධිය සහ පැවැත්ම ඇති කරන වැඩ කටයුතුවල නිරත වීම;

(ආ) සාමාජිකයන්ගේ ආර්ථික හා සමාජයීය ප්‍රවර්ධනය ඇති කිරීම;

(ඇ) කෘෂිකර්මය නවීකරණය කිරීම සඳහා සාමාජිකයන්හට තාක්ෂණික සහාය සහ තොරතුරු සැපයීම;

(ඈ) කර්මාන්ත පවත්වා ගෙන යන හෝ කර්මාන්ත පිහිටුවීමට සැලසුම් කරන සාමාජිකයන්ට සහාය සහ උපදේශක සේවා සලසා දීම;

(ඉ) සේවා සැපයීම පිණිස හෝ වෙළඳාමක යෙදීම පිණිස තනි සාමාජිකයන්ට හෝ සාමාජික කණ්ඩායම්වලට ආධාර දීම;

ජ 080567—6,700 (84/11)

(ඊ) ස්වයං සේවා නියුක්ති ව්‍යාපෘති ආරම්භ කිරීමෙහිලා තැනැත්තන්ට ආධාර දීම ; සහ

(උ) සංස්ථාවේ සියලුම හෝ යම් පරමාර්ථ සපුරාලීම සඳහා හිතකර හෝ ආනුෂංගික වන සියලු ක්‍රියා හා දේවල් කිරීම

විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ විධිවිධානවලට හා වෙනත් යම් ලිඛිත නීතිවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම හා අවසාන කිරීම ද ඇප ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීම හා ලබා ගැනීම ද, ප්‍රදාන හා පරිත්‍යාග භාර ගැනීම හා එකතු කිරීම ද ස්වකීය මුදල් ආයෝජනය කිරීම ද සංස්ථාව දරන යම් ඉඩමක යම් ගොඩනැගිල්ලක් හෝ ව්‍යුහයක් ඉදි කිරීම ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාවේ යෙදීමට අවශ්‍ය සේවක මණ්ඩල යොදා ගැනීම, සේවයෙහි නියුක්ත කිරීම හා පහ කිරීම ද ඇතුළුව, ස්වකීය පරමාර්ථ හෝ ඉන් කිසිවක් හෝ ඉෂ්ට කර ගැනීමට අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු හා දේවල් කිරීමට, ඉටු කිරීමට හා ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය.

5. (1) සංස්ථාවේ තත්කාලයේ රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම ඒ රීතිවලට අනුකූලව තෝරාපත් කර ගන්නා ලද කාර්‍යාධිකාරී මණ්ඩලයක් විසින් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කාර්‍යාධිකාරී මණ්ඩලය, මේ පනත ආරම්භ වන දිනයේ දී ධුරය දරන සංගමයේ කාර්‍යාධිකාරී මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද, කාර්‍යාධිකාරී මණ්ඩලය තෝරාපත්කර ගැනීම සඳහා ද සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ සපුරාලීම සඳහා ද මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. ඒ රීති සාදනු ලැබූ කල්හි එවැනි රැස්වීමක දී ඒ ආකාරයෙන් ම ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

7. (1) කාර්‍යාධිකාරී මණ්ඩලය විසින් "ශ්‍රී ලංකා සාමෝදය පදනමේ අරමුදල" නම් වන (මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) සංස්ථාව සඳහා ද සංස්ථාව වෙනුවෙන් සහ සංස්ථාවේ කාර්ය සඳහා ද මෙතෙක් භාර ගත් හෝ මින් මතු භාර ගනු ලබන, ත්‍යාග, රික්ථවරණ, පැවරීම්, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් වූ සියලු මුදල් කාර්‍යාධිකාරී මණ්ඩලය විසින් නිර්ණය කරනු ලබන එක බැංකුවක හෝ බැංකු කීපයක අරමුදලේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ වූ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කාර්ය ඉටු කිරීමේ දී සහ කටයුතු කිරීමේ දී, සංස්ථාව විසින් දරනු ලැබූ යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**ගිණුම් හා විගණනය.**

8. (1) සංස්ථාවේ ආදායම හා වියදම්, වත්කම් හා බැරකම් හා වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් පැවැත්වීමට කාර්‍යාධිකාරී මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් කාර්‍යාධිකාරී මණ්ඩලය විසින් පත් කරන ලද සුදුසුකම් ලත් විගණකවරයකු හෝ විගණකවරුන් විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

**සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.**

9. යම් මිල දී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ තෙස්ත මේන්තු නියෝදනයක් මගින් නැතහොත් අන්‍යාකාරයෙන් සංස්ථාව වෙත සතු කරනු ලැබිය හැකි කවර වූ හෝ චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමටත්, දැරීමටත්, එමෙන්ම, සංස්ථාවේ රීතිවලට යටත්ව, ඒ දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීමටත් සම්පූර්ණ බලය ඇතිව සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට යටත්ව මේ පනතේ කාර්ය සඳහා ඒ සියලු දේපළ දැරීමට සංස්ථාවට නීත්‍යනුකූල ශක්තතාව ඇත්තේ ය.

**සංගමය විසින් හා සංගමයට ගෙවිය යුතු ණය.**

10. මේ පනතේ කාර්ය සඳහා පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී පැවති සංගමයේ සියලු ණය හා බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර සංගමයට ගෙවිය යුතු සියලු ණය, ග්‍රාහක මුදල් හා දායක මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව තබන ආකාරය.**

11. සංස්ථාවේ සභාපතිවරයා සහ ලේකම්වරයා හෝ භාණ්ඩාගාරිකවරයා ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතුය. තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම සහ අත්සන් කළ යුතු අතර ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් අත්සන් කිරීමට පරිබාහිර විය යුතු ය.

**ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

12. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් හෝ නොවිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 යි (විදේශීය) රු. 200 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.